# UNIVERSITY GRANTS COMMISSION

මුදල් චක්‍රලේඛ ලිපි අංක **6/2011**

2011.06.01

විශ්වවිද්‍යාලවල උපකුලපතිවරුන්,
ආයතනවල අධ්‍යක්ෂවරුන්,
මණ්ඩපවල මණ්ඩපාධිපතිවරුන් වෙත.

**රාජ්‍ය ආයතන පරිශ්‍රයන් තුල භාවිතයට නොගෙන ගාල් කර ඇති රජයට අයත් වාහන අළුත් වැඩියාව/අපහරණ කටයුතු සිදුකිරීම සඳහා කඩිනම් පියවර ගැනීම**

ඉහත කරුණ සම්බන්ධව මුදල් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කර ඇති අංක PF/FS/A.Vehi/2011 හා 2011.05.06 දිනැති ලිපිය මේ සමඟ එවා ඇත. එම උපදෙස් අනුව ඉක්මන් ක්‍රියා මාර්ග ගන්නා ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම චක්‍රලේඛ ලිපිය විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා **www.ugc.ac.lk** වෙබ් අඩවියෙන් ලබා ගත හැක.

මහාචාර්ය එස්.වී.ඩී.ජී. සමරනායක
සභාපති

පිටපත්.
1. සභාපති/වි.ප්‍ර.කො.ස.
2. උප සභාපති/වි.ප්‍ර.කො.ස.
3. ලේකම්/වි.ප්‍ර.කො.ස.
4. ගණකාධිකාරී/වි.ප්‍ර.කො.ස.
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක/වි.ප්‍ර.කො.ස.
6. විශ්වවිද්‍යාලවල ලේඛකාධිවරුන්
7. විශ්වවිද්‍යාලවල මූල්‍යාධිකාරිවරුන්
8. ආයතන/මණ්ඩපවල ජ්‍යෙ. ස. ලේඛාධිකාරි/සහකාර ලේඛාධිකාරිවරුන්
9. ආයතන/මණ්ඩපවල ජ්‍යෙ. ස. මූල්‍යාධිකාරි/සහකාර මූල්‍යාධිකාරිවරුන්
10. ඉංජිනේරු අංශය/ වි.ප්‍ර.කො.ස.
11. ජ්‍යෙ. ස. ගණකාධිකාරි/වි.ප්‍ර.කො.ස.
12. ජ්‍යෙ. ස. ලේකම්/පාලන සහ සැපයුම්
13. විගණකාධිපති
14. රජයේ විගණන අධිකාරි/වි.ප්‍ර.කො.ස.
15. විශ්වවිද්‍යාලවල රජයේ විගණන අධිකාරිවරු

# මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் அமைச்சு
MINISTRY OF FINANCE AND PLANNING

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01, இலங்கை | The Secretariat, Colombo 01, Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: 2484500, 2484600, 2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11 - 2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


11 MAY 2011

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | PF/FS/A.Vehi/2011 | ඔබේ අංකය / உமது இல. / Your No. | | දිනය / திகதி / Date | 2011.05.06 |

සියළුම අමාත්‍යංශ ලේකම්වරුන් වෙත,

**රාජ්‍ය ආයතන පරිශ්‍රයන් තුල භාවිතයට නොගෙන ගාල් කර ඇති රජයට අයත් වාහන අළුත්වැඩියාව /අපහරණ කටයුතු සිදු කිරීම සඳහා කඩිනම් පියවර ගැනීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් අංක PF/FS/A.vehi/2009 හා 2010-02-16 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ලිපිය මගින් නිකුත් කර ඇති උපදෙස් කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරවමි.

භාවිතයට නොගන්නා හා අළුත්වැඩියාවන් අපේක්ෂාවෙන් දීර්ඝ කාලයක් තුළ ගාල් කර තබා ඇති රජයේ වාහන කඩිනමින් අළුත්වැඩියා හා අපහරණ කටයුතු අවසන් නොකිරීම හේතුවෙන් එම වාහනවල ආර්ථික ඵලදායීතාව හීන වී යාම මෙන්ම එබඳු පරිශ්‍රයන් නඩත්තුව හා ආරක්ෂාව සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදුව ඇති බව භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ඉහත ලිපියෙන් අවධාරණය කර ඇත. එම ලිපියෙහි සඳහන් උපදෙස් පරිදි අදාල වාහන අළුත්වැඩියා සහ අපහරණ කටයුතු 2011.06.30 දිනට පෙර අවසන් කළ යුතු බව මෙයින් දන්වමි. වාහන සඳහා ඉල්ලුම් කිරීමට පෙර භාවිතයට ගත නොහැකි වාහන අපහරණය කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලමි.

අපහරණය කරනු ලබන වාහන අලෙවියෙන් ලැබෙන මුදල් රජයේ ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට අවශ්‍ය කටයුතු කළ යුතුය.

විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් සඳහා තීරු බදු සහන යටතේ ආනයනය කර ඇති වාහන දේශීය වෙළඳපොලෙහි විකිණීමට පෙර අදල බදු අත්හැරීම් සඳහා වන ඉල්ලීම් වෙළඳ, තීරු බදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගත යුතුය.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම්

FROM : DG-PUB FIN PHONE NO. : 01 2431458+ May. 31 2011 11:47AM P1

Attention Chief Accountant

PF/FS/A.vehi./2009 2010.07. 16

සියලුම අමාත්‍යාංශ ලේකම් වරුන් වෙත.

[illegible]

**<u>රාජ්‍ය ආයතන පරිශ්‍රයන් තුළ භාවිතයට නොගෙන ගාල්කර ඇති හා අළුත්වැඩියාවට ඇති රජයට අයත් වාහන සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීම</u>**

රාජ්‍ය ආයතන සතු වාහන ඇතුළු වත්කම් පවත්වාගෙන යාම, නඩත්තුව සහ අපහරණය පිළිබඳව සවිස්තරාත්මක උපදෙස්, මුදල් රෙගුලාසිවල සහ භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති අංක 353, 353(1), 353(2), 353(3), 353(4) හා 353(5) දරණ චක්‍රලේඛවල සඳහන් කර ඇත. සමහර රාජ්‍ය ආයතන මෙම උපදෙස් නිසි අයුරින් අනුගමනය නොකිරීම හේතුවෙන්, භාවිතයට නොගන්නා වාහන විනාශයට පත්වෙමින් පවතින බව විවිධ ජනමාධ්‍ය මගින් නිතර වාර්තා කරනු දැකිය හැකිය. එවැනි වාහන ගාල් කර තැබීම සඳහා ආයතන සතු සීමිත ඉඩ වෙන් වන අතර, එම වාහන අළුත්වැඩියා කර ප්‍රයෝජනයට නොගැනීම හෝ කඩිනමින් අපහරණය නොකිරීම නිසා ඒවායේ වටිනාකම අඩුවී රජයට මූල්‍යමය අවාසි සිදුවීම සහ අළුත්වැඩියා වියදම් ඉහළ යාමෙන් ගැටළු රැසක් ඇතිවේ.

02. තවද රජයේ ආයතනවල පාවිච්චියට නොගන්නා වත්කම් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග 2009.11.13 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ 438 හි 6 ඡේදයෙන් පහත සඳහන් උපදෙස් ලබා දී ඇත.

> "රාජ්‍ය ආයතනවල කාර්යාල පරිශ්‍රයන්හි සහ ගබඩාවල දිගු කාලයක් ගොඩගැසී ඇති භාණ්ඩ 2009.12.31 දින වන විට අපහරණය කරනු ලබන බව සහ ඉන් ඉදිරියට එසේ රැස්වන භාණ්ඩ අපහරණය කිරීමේ ක්‍රියාවලිය, ත්‍රෛමාසිකව ආයතන ප්‍රධානීන් විසින් සමාලෝචනයට භාජනය කළ යුතුය."

03. විවිධ හේතූන් මත භාවිතයට ගනු නොලබන ඔබ අමාත්‍යාංශය හා ඊ යටතේ ඇති සියළු ආයතනවලට අයත් වාහන කාර්යක්ෂම ලෙස උපයෝජනය කර ගැනීමට, නඩත්තු කිරීමට, අළුත්වැඩියා කිරීමට සහ ආර්ථික වශයෙන් ඵලදායී නොවන වාහන කඩිනමින් අපහරණය කර අවසන් කිරීමට කඩිනම් ක්‍රියා මාර්ග ගතයුතු බව අවධාරණය කරමි.

04. ඉහත උපදෙස් පරිදි අළුත්වැඩියාවන් කොට ප්‍රයෝජනයට ගනු ලැබූ, අපහරණය කල හා තවදුරටත් තබා ගැනීමට සිදු වී ඇති වාහන පිළිබඳ තොරතුරු, එසේ තබා ගැනීමට බලපා ඇති හේතූද ඇතුලත් වාර්තාවක් 2010.09.30 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවීමට කටයුතු කරන්න.

05. මින් ඉදිරියට කිසියම් වාහනයක් අළුත්වැඩියා කලයුතු හෝ අපහරණය කල යුතු තත්වයට පත් වී මාස තුනක් ඇතුලත, අවශ්‍ය ක්‍රියා මාර්ග ගෙන එම වාහන අළුත්වැඩියාවට හෝ අපහරණයට අවශ්‍ය කටයුතු කල යුතු බවද කාරුණිකව දන්වමි.

පී.ඒ. අබේසේකර
භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්

පිටපත:- විගණකාධිපති - දැ. ගැ. ස